# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 අගෝස්තු මස 09 වන දින

## II වන කොටස

## අතිරේකය

(2019.08.09 දින නිකුත් කරන ලදී)

## කල්බදු මූල්‍යකරණ (සංශෝධන)

**2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත**
**සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 24 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ බදු දීමනාකරුවකුට කල් බද්ද යටතේ වූ ස්වකීය අයිතිවාසිකම් බදු ගැනුම්කරුගේ කැමැත්ත නොමැතිව යම් ලියාපදිංචි කරන ලද ආයතනයක් වෙත පැවරීමට හෝ භාර කිරීමට හැකියාව ලබාදීමට විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය :*** මෙම වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ බදු දීමනාකරුවකුට ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වූ ස්වකීය අයිතිවාසිකම් බදු ගැනුම්කරුගේ බුන්වත් වීමක දී භාරකරුවකුට එරෙහිව හෝ බදු ගැනුම්කරුගේ ණය හිමියකුට එරෙහිව බලාත්මක කිරීමට නම් එම අයිතිවාසිකම් 2019 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ වලංගු ලෙස පරිපූර්ණත්වයට පත් කොට තිබිය යුතු බවට විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය :*** මෙම වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් කල්බදු මූල්‍යකරණයක් යටතේ වූ ස්වකීය අයිතිවාසිකම් 2019 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කර ඇති බදු දීමනාකරුවකුට උපකරණයක සන්තකය ආපසු ලබා ගැනීමේ අයිතිය තහවුරු කිරීමට විධිවිධාන සැලැස්වීම වේ.

එල්.ඩී.-ඕ. 66/2017

## 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**1.** මේ පනත 2019 අංක   දරන කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

2000 අංක 56 දරන පනතේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "කල්බදු මූල්‍යකරණයකට එළඹෙන අවස්ථාවක දී හෝ ඉන් පසුව ලබාගත් බදු දීමනාකරුගේ ලිඛිත කැමැත්ත ඇතිව, කල්බදු මූල්‍යකරණය යටතේ වූ" යන වචන වෙනුවට "බදු දීමනාකරුවකු විසින් කල්බදු මූල්‍යකරණය යටතේ වූ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ (1) වන උපවගන්තියේ, "මේ පනත යටතේ බදු දීමනාකරුවකුගේ අයිතිවාසිකම්" යන වචන වෙනුවට "මේ පනත යටතේ වන බදු දීමනාකරුවකුගේ අයිතිවාසිකම්, ඒ බදු දීමනාකරු විසින් 2019 අංක   දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ වලංගු ලෙස පරිපූර්ණ කර ඇත්නම්," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ "මේ පනත යටතේ හෝ කල්බදු මූල්‍යකරණයක විධිවිධානයක් යටතේ," යන වචන වෙනුවට "2019 අංක   දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ හෝ තරගකාරී හිමිකම්පාන්නන් කිසිවකු නොමැති අවස්ථාවක දී කල්බදු මූල්‍යකරණයක විධිවිධානයක් යටතේ," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.